# ශ්‍රී ලංකා ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය

**සංඛ්‍යාන දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව**

නිෂ්පාදන සහ සේවා කටයුතු වලට අදාල ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක සමීක්ෂණයෙහි ප්‍රතිඵල

වැදගත් කරුණු:

2020 පෙබරවාරි මාසයේ දී නිෂ්පාදන අංශයේ ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය මන්දගාමීත්වයක් පෙන්නුම් කරමින්, දර්ශක අගය 53.6 ක් ලෙස වාර්තා විය. නව ඇණවුම් සහ සේවා නියුක්තියෙහි සිදුවූ මන්දගාමී වර්ධනය මේ සඳහා ප්‍රධාන වශයෙන්ම හේතු වූ අතර, නව කොරෝනා වෛරසයේ (COVID-19) බලපෑම හේතුවෙන්, ඉදිරි මාස තුන සඳහා අපේක්ෂාවන් සැලකිය යුතු ලෙස පහළ ගොස් ඇත.

නව ඇණවුම් සහ සේවා නියුක්තිය යන උප දර්ශක අඩු වේගයකින් ඉහළ යාම කෙරෙහි විශේෂයෙන්ම, රෙදිපිළි හා ඇඟළුම් නිෂ්පාදන අංශයෙහි පැවති ගෝලීය ඉල්ලුම පහළ යාම ප්‍රධාන වශයෙන් හේතු විය. තවද, නව කොරෝනා වෛරසයේ (COVID-19) බලපෑම හේතුවෙන්, අමු ද්‍රව්‍ය ආනයනය ප්‍රමාද වූ බව රෙදිපිළි හා ඇඟළුම් නිෂ්පාදන අංශයෙහි බොහෝමයක් ප්‍රතිචාර දක්වන්නන් විසින් අවධාරණය කරන ලදී. මෙලෙස නව කොරෝනා වෛරසයෙන් (COVID-19) සැපයුම් ජාලයට වූ බලපෑම හේතුවෙන් ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය මෙලෙස තවදුරටත් ඉහළ ගිය අතර, එය සමස්ථ දර්ශකය ඉහළ යාම සඳහා හේතුවන ලදී.

මේ අතර, ඉදිරියට පැමිණෙන උත්සව සමයට සූදානම් වීම හේතුවෙන් ආහාර හා පාන වර්ග නිෂ්පාදන අංශයෙහි, නිෂ්පාදන සහ තොග මිලදී ගැනුම්හි සුළු වර්ධනයක් දක්නට ලැබුණි.

සේවා නියුක්තිය උප දර්ශකය හැර ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකයෙහි අනෙකුත් සියලුම උප දර්ශක, කඩඉම් මට්ටම ලෙස ගැනෙන දර්ශක අගය වන 50.0 ට වඩා වැඩි අගයක් වාර්තා කරමින්, අඩු වේගයකින් වුවද නිෂ්පාදන ක්‍රියාකාරකම්වල සමස්ත වර්ධනයක් පෙන්නුම් කරන ලදී.

| විචල්‍යය | ජන. | පෙබ. | +/- | සාරාංශය |
|---|---|---|---|---|
| **ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය** | **54.0** | **53.6** | **-** | **අඩු වේගයකින් ඉහළ යෑමක්** |
| | | <u>**උප දර්ශක**</u> | | |
| නව ඇණවුම් | 54.5 | 51.1 | - | අඩු වේගයකින් ඉහළ යෑමක් |
| නිෂ්පාදන | 54.0 | 54.8 | + | වැඩි වේගයකින් ඉහළ යෑමක් |
| සේවා නියුක්තිය | 49.5 | 47.3 | - | වැඩි වේගයකින් පහළ යෑමක් |
| තොග මිලදී ගැනුම් | 50.5 | 52.2 | + | වැඩි වේගයකින් ඉහළ යෑමක් |
| ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය | 61.5 | 66.1 | + | වැඩි වේගයකින් ඉහළ යෑමක් |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව


විශේෂයෙන්ම ඇඟළුම් නිෂ්පාදකයින් සඳහන් කළ පරිදි නව කොරෝනා වෛරසය මගින් ගෝලීය සැපයුම් පද්ධතිය කෙරෙහි බලපෑමක් ඇති කළ හැකි බැවින්, ඉදිරි මාස තුන සඳහා නිෂ්පාදන ක්‍රියාකාරකම්වල සමස්ථ අපේක්ෂාවන් පෙර මාසය හා සැසඳීමේදී සැලකිය යුතු ලෙස පහළ ගොස් ඇත.

**ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක අගය**

**53.6**

**2020 ජනවාරි මාසයට සාපේක්ෂව දර්ශකාංක 0.4 ක පහළ යාමකි.**

නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

**ගෝලීය ප්‍රවණතා: නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය**

ගෝලීය ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය, 2020 ජනවාරි මාසයට සාපේක්ෂව දර්ශකාංක 3.2 කින් පහළ යමින් 2020 පෙබරවාරි මාසයේදී 47.2 ක දර්ශක අගයක් වාර්තා කරන ලදී. COVID-19 මගින් සැපයුම් දාමයට හා ඉල්ලුමට ඇතිවූ බලපෑම හේතුවෙන් ඇතිවූ මෙම පහළ වැටීම, දශකයකට වැඩි කාලයක් තුළ වාර්තා වූ විශාලතම පහළ වැටීම වේ.

2020 පෙබරවාරි මාසයේදී, චීනයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය පහළ ගිය අතර එක්සත් ජනපදය සහ ඉන්දියාවෙහි නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක මන්දගාමී විය. එක්සත් රාජධානියෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය වර්ධනය විය. යුරෝපා කලාපය සහ රුසියාවෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක කඩඉම් මට්ටමට වඩා අඩු මට්ටමක තවදුරටත් පැවතිණි.

*මූලාශ්‍රය: මාකිට්[1] ආයතනය, 2020 මාර්තු 16 වන දිනට*

[1] මාකිට් යනු ලොව ප්‍රධාන පෙලේ මූල්‍ය තොරතුරු සේවා ලබාදෙන ආයතනයකි. මෙය ජාත්‍යන්තරව ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය සම්පාදනය කරන ප්‍රධාන ආයතනයක් වන අතර, එමඟින් යුරෝපා කලාපය ඇතුලුව රටවල් 30 කට අධික ප්‍රමාණයක් සඳහා ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය සම්පාදනය කරනු ලබයි.

**2020 පෙබරවාරි මාසයේ දී සේවා අංශය පසුගිය මාසයට සාපේක්ෂව අඩු වේගයකින් වර්ධනය වූ අතර,** නව කොරෝනා වෛරසයෙහි (COVID-19) බලපෑම නිසා නව ව්‍යාපාර, ව්‍යාපාර ක්‍රියාකාරකම් සහ අපේක්ෂිත ඉදිරි ව්‍යාපාර ක්‍රියාකාරකම්හි වර්ධනය මන්දගාමී වීම මේ සඳහා හේතු විය.

නව කොරෝනා වෛරසයෙහි බලපෑම හේතුවෙන් චීන සංචාරකයින්ගේ පැමිණීම් සහ නැවිගත කිරීම් අඩු වීම නිසා නවාතැන් සහ ආහාරපාන සැපයීමේ සේවා සහ ප්‍රවාහන උප අංශවල ව්‍යාපාර ක්‍රියාකාරකම්හි අඩු වීමක් වාර්තා විය. තවද, පසුගිය මාසයට සාපේක්ෂව මූල්‍ය සේවා සහ වෘත්තීය සේවා යන උප අංශවල ද අඩු වීමක් වාර්තා විය. මෙහි ප්‍රතිඵලයක් වශයෙන්, සේවා අංශයෙහි සමස්ත ව්‍යාපාර ක්‍රියාකාරකම් පසුගිය මාසයට සාපේක්ෂව 2020 පෙබරවාරි මාසයේ දී අඩු වේගයකින් වර්ධනය විය. මේ අතර, පසුගිය මාසයට සාපේක්ෂව සේවා අංශයෙහි බොහොමයක් උප අංශවල නව ව්‍යාපාර ද පහළ ගිය අතර, ප්‍රවාහන සහ වෙනත් පෞද්ගලික සේවා උප අංශවල පහළ යෑම ප්‍රමුඛ විය.

නව කොරෝනා වෛරසයෙන් සිදුවිය හැකි බලපෑම හේතුවෙන් 2020 පෙබරවාරි මාසයේ දී අපේක්ෂිත ව්‍යාපාර ක්‍රියාකාරකම්හි වර්ධනය සැලකියයුතු ලෙස අඩු වූ අතර, නවාතැන් සහ ආහාරපාන සැපයීමේ සේවා; සහ ප්‍රවාහන උප අංශවල එම අඩුවීම ප්‍රධාන වශයෙන් දක්නට ලැබුණි. තවද, තොග සහ සිල්ලර වෙළෙඳ කටයුතුවල, විශේෂයෙන් ජාත්‍යන්තර වෙළෙඳාමෙහි, සහ මූල්‍ය සේවා කටයුතුවල නිරත ප්‍රතිචාර දක්වන්නන් ද ඉදිරි මාස කිහිපය තුළ ව්‍යාපාර ක්‍රියාකාරකම්හි පහළ යෑමක් අපේක්ෂා කරන බව සඳහන් කර තිබුණි. ව්‍යාපාර ක්‍රියාකාරකම් සහ අපේක්ෂිත ව්‍යාපාර ක්‍රියාකාරකම්වල වර්ධනයෙහි සිදු වූ පහළ යෑම හේතුවෙන් 2020 පෙබරවාරි මාසයේ දී සේවා නියුක්තිය පහළ ගිය අතර, එමගින් නිමකිරීමට නියමිත කාර්යයන්හි පහළ යෑම සීමා විය.

| විචල්‍යය | ජන. | පෙබ. | +/- | සාරාංශය |
|---|---|---|---|---|
| **ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය** | **57.0** | **50.2** | **-** | **අඩු වේගයකින් ඉහළ යෑමක්** |
| | | **උප දර්ශක** | | |
| නව ව්‍යාපාර | 60.4 | 52.7 | - | අඩු වේගයකින් ඉහළ යෑමක් |
| ව්‍යාපාර ක්‍රියාකාරකම් | 61.4 | 53.8 | - | අඩු වේගයකින් ඉහළ යෑමක් |
| සේවා නියුක්තිය | 52.5 | 46.2 | - | ඉහළ යෑමක සිට පහළ යෑමක් |
| නිමකිරීමට නියමිත කාර්යයන් | 44.1 | 45.8 | + | අඩු වේගයකින් පහළ යෑමක් |
| අපේක්ෂිත ඉදිරි ව්‍යාපාර ක්‍රියාකාරකම් | 66.5 | 52.7 | - | අඩු වේගයකින් ඉහළ යෑමක් |


මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

**ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක අගය**

**50.2**

**2020 ජනවාරි මාසයට සාපේක්ෂව දර්ශකාංක 6.8කා පහළ යාමකි.**

සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

**ගෝලීය ප්‍රවණතා: සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය**

නව කොරෝනා වෛරසයෙහි බලපෑම හේතුවෙන් ගෝලීය සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය, 2020 ජනවාරි මාසයේ දී වාර්තා වූ 52.7 හි සිට 2020 පෙබරවාරි මාසයේ දී 47.1 ක් දක්වා පහළ යන ලද අතර එය අවුරුදු 11කින් පමණ පසු වාර්තා වූ අවම අගයයි.

මෙම පහළ යෑමට චීනය, ඇමරිකා එක්සත් ජනපදය, ජපානය සහ ඕස්ට්‍රේලියාව යන රටවල නිමවුම් මට්ටමෙහි සිදු වූ පහළ යෑම හේතු විය. කෙසේ වුවද, එක්සත් රාජධානිය සහ ඉන්දියාව යන රටවල සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක මගින් එම රටවල සේවා අංශ පසුගිය මාසයට සාපේක්ෂව 2020 පෙබරවාරි මාසයේ දී වර්ධනය වූ බව පෙන්නුම් කරන ලදී.

*මූලාශ්‍රය: මාකිට්[1] ආයතනය, 2020 මාර්තු 17 වන දිනට*

***තාක්ෂණික සටහන:***

**දර්ශකය**

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය 0 සිට 100 අතර අගයන් පරාසයක විහිදී ඇත.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට සමාන නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී නොවෙනස්ව පැවතී ඇත.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට වඩා වැඩි නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී වර්ධනයක් පෙන්නුම් කරයි.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට වඩා අඩු නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී සංකෝචනයට ලක්වී ඇති බව පෙන්නුම් කරයි.

**නියැදිය**

මෙම සමීක්ෂණයෙහි නියැදි රාමුව සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුවෙන් ලබාගන්නා ලද බස්නාහිර පළාතෙහි ස්ථානගත වී ඇති විශාල සමාගම් මත පදනම් වී ඇත. දළ දේශීය නිෂ්පාදිතයට දක්වන ආංශික දායකත්වය පදනම් කර ගනිමින් නිෂ්පාදන සහ සේවා කටයුතු සඳහා මාසිකව අවම වශයෙන් ප්‍රතිචාර 100 බැගින් වූ ඉලක්කයක් පවත්වාගෙන යනු ඇත.

**විචල්‍යයන්ගේ අර්ථ නිරූපණයන්**

| | |
|---|---|
| සේවා නියුක්තිය | : සමාගම සඳහා සේවය ලබාදෙන සේවකයන් ගණන |
| ගැනුම් තොගය | : නිෂ්පාදනය සඳහා යොදාගැනීමේ අරමුණින් මිල දී ගෙන ගබඩාවෙහි තබා ඇති අමු ද්‍රව්‍ය |
| ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය | : සැපයුම්කරුවෙකුට ඇණවුමක් ලබාදීමෙන් පසු එය කර්මාන්ත ශාලාවට ලැබීමට ගතවන කාලය |
| නිමකිරීමට නියමිත කාර්යයන් | : ව්‍යාපාරික ක්‍රියාකාරකම් ඉහළයාම හේතුවෙන් නිම කිරීමට නොහැකි වූ ඇණවුම් |

අනෙකුත් විචල්‍යයන් ඒවා නම් කිරීම සඳහා යොදා ඇති වචනාර්ථයෙන්ම පැහැදිලි වේ.